## කාබනික හා රසායනික පොහොර දෙවර්ගයම යෙදීම

පොහොර යෙදීමේ වඩාත් සාර්ථක ක්‍රමය කාබනික පොහොර හා රසායනික පොහොර දෙවර්ගයම යෙදීමයි. කාබනික පොහොර යෙදීමේදී ඒ සමඟ මූලික, ද්විතික හා අංශු මාත්‍ර මූලද්‍රව්‍ය එක්වීම නිසා යොදනු ලබන රසායනික පොහොර ප්‍රමාණය අඩුකර යෙදිය හැකි අතර, බොහෝවිට ද්විතික හා අංශුමාත්‍ර මූලද්‍රව්‍ය රසායනික පොහොර ලෙස යෙදීමට අවශ්‍ය නොවනු ඇත. මෙලෙස කාබනික පොහොර හා රසායනික පොහොර දෙවර්ගයම භාවිතා කිරීම "ඒකාබද්ධ පැළෑටි පෝෂණ ක්‍රමවේදය" ලෙස හැඳින්වේ. මෙම ක්‍රමවේදය වැඩි අස්වැන්නක් ලබා ගැනීම සඳහා පොහොර භාවිතා කිරීමේ වඩාත් නිවැරදි හා සාර්ථක ක්‍රමය ලෙස පිළිගැනේ.

විවිධ බෝග ආශ්‍රිතව සිදුකරන ලද පර්යේෂණ ගණනාවක් මඟින් පෙනී ගොස් ඇත්තේ, කාබනික පොහොර හා රසායනික පොහොර දෙවර්ගයම යෙදීම තුලින් කාබනික පොහොර පමණක් හෝ රසායනික පොහොර පමණක් යෙදීමට වඩා වැඩි අස්වැන්නක් හා වැඩි ලාභයක් ලබා ගතහැකි බවයි.

## ඒකාබද්ධ පැළෑටි පෝෂණ ක්‍රමවේදයේ වාසි

- කාබනික පොහොර පමණක් හෝ රසායනික පොහොර පමණක් යොදා සිදුකරනු ලබන වගාවන්ට වඩා වැඩි අස්වැන්නක් ලබාගැනීමට හැකි වීම
- වගාව ආර්ථික වාසිදායක වීම
- යොදනු ලබන රසායනික පොහොරවලින් උපරිම ප්‍රයෝජනයක් ලබාගැනීමට හැකි වීම
- යෙදිය යුතු රසායනික පොහොර ප්‍රමාණය අඩු කර යෙදිය හැකි වීම
- පසේ පෝෂ්‍ය පදාර්ථ ප්‍රශස්ථ තත්වයෙන් පවත්වා ගතහැකි වීම
- පසෙන් පෝෂ්‍ය පදාර්ථ සේදී අපතේ යාම අඩුවීම
- පස සාරවත් වීම
- බෝගවලට අවශ්‍ය පෝෂ්‍ය පදාර්ථ වර්ග සියල්ලම පාහේ ලබාදීමේ හැකියාව
- කාබනික පොහොර යෙදීම නිසා පසේ බුරුල් බව ඇතිවීම
- යොදනු ලබන රසායනික පොහොර දියවී භූගත ජලයට එක්වීම අවම වීම

## කාබනික පොහොර හා රසායනික පොහොර දෙවර්ගයම යෙදීම නිසා බෝග අස්වැන්න වැඩි වීම

| පොහොර | අස්වැන්න (අක්කරයකට ටොන්) ගෝවා | තක්කාලී |
|---|---|---|
| නිර්දේශිත එන්.පී.කේ. රසායනික පොහොර | 24 | 3 |
| අක්කරයකට ටොන් 4.5 ක් කුකුළු පොහොර | 26 | 8 |
| නිර්දේශිත එන්.පී.කේ. රසායනික පොහොර + අක්කරයකට ටොන් 4.5 ක් කුකුළු පොහොර | 39 | 11 |

2011

සැකසුම:
ආචාර්ය ජේ.ඩී. හේමන්ත විජේවර්ධන,
අධ්‍යක්ෂ (කාබනික පොහොර)
කෘෂිකර්ම අමාත්‍යාංශය,
"ගොවිජන මන්දිරය",
අංක 80/5, රජමල්වත්ත පටුමග,
බත්තරමුල්ල.
දුරකථන අංක: 011-2885409
ෆැක්ස්: 011-2885409
ඊ මේල්: Wijehema@yahoo.com

*කෘෂිකර්ම අමාත්‍යාංශයේ කාබනික පොහොර නිෂ්පාදනය සහ භාවිතය දිරි ගැන්වීමේ වැඩසටහන අනුග්‍රහයෙනි.*

Designed by: **AUDIO VISUAL CENTRE**, Department of Agriculture, Peradeniya.
Printed by: **AGRICULTURE PRESS**, Gannoruwa.

"අපි වවමු - රට නඟමු"

කොම්පෝස්ට් නිෂ්පාදනය - 10

# කොම්පෝස්ට් භාවිතා කරන ආකාරය





කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ප්‍රකාශනයකි

නිපදවාගත් හෝ මිලදීගත් කොම්පෝස්ට්, බෝග සඳහා ක්‍රමානුකූලව භාවිතා කළයුතුය. ක්‍රමානුකූලව ඒවා භාවිතා කිරීමෙන් කොම්පෝස්ට් මඟින් උපරිම ප්‍රයෝජනයක් ලබාගත හැකි අතර, බෝගවල සාර්ථක වර්ධනයක් හා අස්වැන්නක් ලබාගැනීමටද හැකි වේ. බෝගයක සාර්ථක අස්වැන්නක් ලබා ගැනීමට රසායනික පොහොර පමණක් හෝ කාබනික පොහොර පමණක් යෙදීම සුදුසු නොවනු ඇත. බෝග වගාවේ සාර්ථකත්වය සඳහා මෙන්ම වැඩි අස්වැන්නක් සඳහා කාබනික පොහොර හා රසායනික පොහොර දෙවර්ගයම වගාවට යෙදිය යුතු වේ.

## වී වගාව

වෙනත් නොදිරූ කාබනික පොහොර මෙන් නොව, කොම්පෝස්ට් හොඳින් දිරාපත් වී ඇති නිසා වී වගාව සිදුකරන දිනයේදී පවා බිම් සකස් කිරීමට ප්‍රථම ලියද්දට යෙදිය හැකිය.

- සාරවත් පසක් ඇති කුඹුරකට කොම්පෝස්ට් පොහොර අක්කරයකට ටොන් 1 ක් පමණ යෙදීම ප්‍රමාණවත් වේ
- සාරවත් පසක් නොවන හෝ වැලි සහිත කුඹුරකට කොම්පෝස්ට් පොහොර අක්කරයකට ටොන් 2 ක් පමණ යෙදිය හැකිය
- කොම්පෝස්ට් පොහොර යොදා හොඳින් පසට කවලම් වන සේ පස සකස් කරන්න
- මූලික බිම් සකස් කිරීමේදී රසායනික පොහොර ද යෙදිය යුතුය
- කොම්පෝස්ට් පොහොර යෙදීම මඟින් යොදනු ලබන රසායනික පොහොර ප්‍රමාණය සැලකිය යුතු ලෙස අඩුකර ගතහැකි වේ
- කාබනික පොහොර පමණක් යොදා සිදුකරන කාබනික වී වගාවේදී නම්, කොම්පෝස්ට් මතුපිට පොහොර ලෙස පවා යෙදිය හැකිය

## එළවළු හා අතිරේක ආහාර බෝග

එළවළු හා අතිරේක ආහාර බෝග ගොඩ බෝග වන අතර බොහෝ විට ඒවා මාස 3 - 4 ක් වැනි කෙටි ජීවන කාලයක් ඇත. එළවළු හා අතිරේක ආහාර බෝග සිටුවන භූමියේ වලවල්වලට හෝ නෙරවලට කොම්පෝස්ට් පොහොර යොදා බෝග සිටුවනු ඇත.

- පහතරට එළවළු බෝග සඳහා කොම්පෝස්ට් අක්කරයකට ටොන් 2 - 3 ක් පමණ යොදන්න
- උඩරට එළවළු බෝග සඳහා කොම්පෝස්ට් අක්කරයකට ටොන් 4 - 4.5 ක් පමණ යොදන්න
- අතිරේක ආහාර බෝග වර්ග සඳහා කොම්පෝස්ට් අක්කරයකට ටොන් 1 - 2 ක් පමණ යෙදිය හැකිය
- එළවළු හා අතිරේක ආහාර බෝග වගාවේදී වලවල්වලට හෝ නෙරවලට කොම්පෝස්ට් යොදා පස සමඟ කලවම් කරන්න
- එළවළු හා අතිරේක ආහාර බෝග සඳහාද කොම්පෝස්ට් යෙදීම නිසා රසායනික පොහොර සැලකිය යුතු ලෙස අඩුකර යෙදිය හැකි වේ
- කාබනික පොහොර යෙදීම පමණක් සිදුකරන කාබනික වගාවේදී නම්, කොම්පෝස්ට් මතුපිට පොහොර ලෙස පවා යෙදිය හැකිය



## බහුවාර්ෂික පලතුරු බෝග

බොහෝ පලතුරු බෝග වෙනත් වාර්ෂික බෝග මෙන් නොව තම ජීවන කාලය වර්ෂ ගණනාවක් තුළ පවත්වා ගෙන යනු ලැබේ. මේ නිසා පලතුරු සඳහා කාබනික පොහොර යෙදීම වාර්ෂික බෝග මෙන් පැළ හෝ බීජ සිටුවීමේදී මූලික පොහොර ලෙස පමණක් යෙදීම ප්‍රමාණවත් නොවේ.

- පලතුරු පැළ සිටුවීමේදී වලකට කොම්පෝස්ට් කූඩා 1 - 2 ක් යොදා හොඳින් පස සමඟ කලවම් කරන්න
- පැළ සිටුවීමේදී රසායනික පොහොරද යොදා පස සමඟ කලවම් කරන්න
- ඊට පසු මාස 6 කට වරක් නැවත කාබනික පොහොර හා රසායනික පොහොර දෙවර්ගයම යොදන්න
- වැඩුණු පලතුරු ගසක් සඳහා ද කාබනික හා රසායනික පොහොර යෙදීම මාස 6 කට වරක් සිදු කරන්න
- එහිදී වැඩුණු පලතුරු ගසක් සඳහා කාබනික පොහොර කූඩා 3 - 4 ක් ගසකට යොදන්න
- පලතුරු සඳහා කාබනික පොහොර යෙදීමේදීද නිර්දේශිත රසායනික පොහොර ප්‍රමාණය සැලකිය යුතු ලෙස අඩුකර යෙදිය හැකිය
- කාබනික පොහොර යෙදීමේදී ඒවා පසට එක්කර හොඳින් මුල්ලු කරන්න
- වර්ෂාව ආරම්භ වීමත් සමඟ පලතුරු සඳහා පොහොර යෙදීම වඩාත් සාර්ථක වේ